<u>මහජන එක්සත් පෙරමුණ ව්‍යවස්ථාව</u>

01) නම :- මහජන එක්සත් පෙරමුණ

10/21 ඒ, [illegible], නාවල

02) ලිපිනය :- ~~31/27, නාරාහේන්පිට පාර, නාවල, රාජගිරිය~~ හෝ මධ්‍යම කාරක සභාව විසින් තීරණය කර ප්‍රකාශයට පත්කරනු ලබන ස්ථානය

03) ලංඡනය :- ධර්ම චක්‍රය මැදිකර ගත් වී කරල් රැසක් සහ දෙපස කාර්මිකයෙකු හා ගෙවිලියක්ද පක්ෂ නාමය කෙටියෙන් ද සටහන් ලාංඡනය පක්ෂ ලාංඡනය වේ.

04) පරමාර්ථය :- දේශීය චින්තනය පදනම් කරගත් ප්‍රජාතාන්ත්‍රවාදි සමාජවාදී සමාජයක් ගොඩනැගීම.

05) සාමාජිකත්වය :- පක්ෂයේ පරමාර්ථය පිළිගන්නා වයස අවු 18 ට නොඅඩු ශ්‍රී ලාංකික පුරවැසියෙකුට පහත සඳහන් වගකීම් වලට අනුකූලව පක්ෂයේ සාමාජිකත්වය ලබාගැනීමට ඉල්ලුම් කළ හැකිය.

i) පක්ෂ සාමාජිකයින් දෙදෙනෙකුගේ යෝජනා ස්ථිරත්වය ඇතිව, ඉල්ලුම් පත්‍රයක් සම්පූර්ණ කර, මධ්‍යම කාරක සභාව වෙත ඉදිරිපත් කළ යුතුයි. එම ඉල්ලුම් පත්‍රය මධ්‍යම කාරක සභාව විසින් අනුමත කිරීමෙන් පක්ෂයේ සාමාජිකත්වය හිමිවේ.

හෝ

ii) අයදුම්කරු පදිංචි ප්‍රදේශයේ පක්ෂ ශාඛාව වෙත ඉල්ලුම් පත්‍රයක් පක්ෂ සාමාජිකයින් දෙදෙනෙකුගේ යෝජනා ස්ථිරත්වය ඇතිව, ඉල්ලුම් කර පක්ෂ ශාඛාව එම ඉල්ලුම් පත්‍රය අනුමත කිරීමෙන් පසු මධ්‍යම කාරක සභාව වෙත ඉදිරිපත් කොට අනුමැතිය ලබා ගැනීමෙන් සාමාජිකත්වය ලබාගත හැකිය.

iii) වෙනත් දේශපාලන පක්ෂයක සාමාජිකත්වය දරන අයෙකුට මහජන එක්සත් පෙරමුණේ සාමාජිකත්වය ඉල්ලුම් කොට ලබා ගැනීමට නොහැකිය.

iv) <u>සාමාජිකත්වය ලබා ගැනීමේදී ප්‍රවේශ මුදල රු 10/- ක් වන අතර. වාර්ෂික සාමාජික මුදල රු 100/- ක් වේ.එකී වාර්ෂික සාමාජික මුදල වාරික 2 කින්ද ගෙවිය හැකිය.</u>

5) අ) සාමාජිකත්වය අහෝසි වීම :-

i) පකයේ තීරණයන්ට පටහැනිව කටයුතු කිරීම හා / හෝ පක්ෂයට හානිකර කටයුතු කිරීමේ හේතු කොටගෙන මධ්‍යම කාරක සභාව විසින් ගන්නා ලද විනයානුකූල තීරණයකින්

ii) පක්ෂයේ පරමාර්ථ හා පිළිගත් පිලිවෙතට පටහැනිව කටයුතු කිරීම හේතු කොටගෙන පක්ෂයේ මධ්‍යම කාරක සභාව විසින් ගන්නා ලද විනයානු කූල තීරණයකින්,

iii) මහජන එක්සත පෙරමුණ සාමාජිකත්වය දරමින් සිටිද්දි, වෙනයම් දේශපාලන පක්ෂයක සාමාජිකත්වය ලබාගත් අවස්ථාවකදී, මහජන එක්සත් පෙරමුණ සාමාජිකත්වය අහෝසි වේ.

05) ආ) සාමාජිකත්වය අත්හිටුවීම :-

මධ්‍යම කාරක සභාවේ පශ්චාත් අනුමැතියට යටත්ව, පක්ෂයේ සභාපතිගේ අනුමැතිය ඇතිව සාමාජිකයෙකුගේ සාමාජිකත්වය අත්හිටුවීමට ප්‍රධාන ලේකම්ට බලය ඇත.

06) පක්ෂ සංවිධාන ව්‍යුහය :-

i) පක්ෂ ශාඛාව
ii) ප්‍රාදේශීය බල මණ්ඩලය
iii) දිස්ත්‍රික් සංවිධානය
iv) ජාතික සම්මේලනය
v) මධ්‍යම කාරක සභාව
vi) දේශපාලන මණ්ඩලය
vii) මධ්‍යම කාරක සභාව විසින් පත්කරනු ලබන වෙනත් කමිටු හා මණ්ඩල

07) මධ්‍යම කාරක සභාවේ අනුමැතිය ඇතිව, පහත සඳහන් අනුබද්ධ සංවිධාන ඇති කළ හැකිය

i) පැවිදි සංවිධාන
ii) වෛද්‍ය සංවිධාන
iii) ගුරු සංවිධාන
iv) ගොවි සංවිධාන
v) කම්කරු සංවිධාන
vi) තරුණ සංවිධාන
vii) ශිෂ්‍ය සංවිධාන
viii) කාන්තා සංවිධාන
ix) නීතිඥ සංවිධාන
x) මැතිවරණ කොට්ඨාශ සංවිධාන
xi) මේ හා සමාන වෙනත් සංවිධාන

08) පක්ෂයේ මධ්‍යම කාරක සභාව විසින් නම් කොට තෝරා ගනු ලබන 25 දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් යුත් ජාතික උපදේශක සභාවක් පත්කළ හැකිය.

08) අ) මධ්‍යම කාරක සභවේ අනුමැතිය ඇතිව පක්ෂයේ සංවිධාන හා ක්‍රියාකාරීත්වයට උපකාරී වන අනුබද්ධ සංවිධාන ඇති කළ හැකිය.

ආ) මැතිවරණ කොට්ඨාශ පදනම් කොටගත් මැතිවරණ සංවිධාන ඇතිකළ හැකිය. මෙම මැතිවරණ සංවිධානය පක්ෂයට අනුබද්ධ සංවිධානයක් ලෙස සැලකේ.

09) පක්ෂ ශාඛාව :-

i) පක්ෂ ශාඛාව පාක්ෂිකයින්ගෙන් සමන්විත වන්නේය. භූගෝලීය සහ වෙනත් අවශ්‍යතාවයන් අනුව පක්ෂ ශාඛා ඇතිකළ හැකිය. පක්ෂ ශාඛාවක අවම සංයුතිය පස් (05) දෙනෙකුය. සියළුම සාමාජිකයින් පක්ෂ ශාඛාවක සාමාජිකයින් විය යුතුය.

2 පිටුව

ii) ශාඛා නිළධාරීන් :- සභාපති, ලේකම්, භාණ්ඩාගාරික, ඇතුළු අවමය පස්දෙනෙකුගෙන් සමන්විත කාරක සභාවක් ඇතිකර ගත යුතුය.

iii) ඉහත සඳහන් නිළධාරීන්. ශාඛාවේ සාමාජිකයින් අතුරින් වාර්ෂිකව තෝරා පත්කර ගත යුතු අතර, ශාඛාව මසකට වරක් රැස්විය යුතුය.

iv) මධ්‍යම කාරක සභාවට පක්ෂ ශාඛාවක් විසුරුවා හැරීමට බලයක් ඇත. එසේ විසුරුවා හැර මසක් ඇතුළත පක්ෂ ශාඛාව නැවත ඇතිකළ යුතුය.

10) ප්‍රාදේශීය බල මණ්ඩල සංයුතිය :-

i) පළාත් පාලන ඒකක බලප්‍රදේශයක් හෝ මධ්‍යම කාරක සභාව විසින් තීරණය කරනු ලබන බල ප්‍රදේශය බල මණ්ඩලක සාමාන්‍ය බල ප්‍රදේශය වන්නේය.

ii) පක්ෂ ශාඛා වල නිළධාරීන් වන සභාපති, ලේකම්, භාණ්ඩාගාරික සහ එක් කාරක සභිකයෙකු යන 4 දෙනා ප්‍රාදේශීය බල මණ්ඩලයේ සාමාජිකයෝ වෙති.

iii) ප්‍රාදේශිය බල මණ්ඩල නිළධාරීහු :- සභාපති, උප සභාපති, ලේකම්, උප ලේකම්, භාණ්ඩාගාරික යනුවෙන් වෙති. පක්ෂයේ මධ්‍යම කාරක සභාව නියම කරන පිළිවෙත පරිදි ප්‍රාදේශීය බල මණ්ඩලයේ නිළධාරීන් තෝරා පත්කර ගත යුතු වන්නේය.

11) දිස්ත්‍රික් සංවිධානයේ සංයුතිය :-

i) පරිපාලන දිස්ත්‍රික්කයක් තුල පිහිටි සියළුම ප්‍රාදේශීය බල මණ්ඩල වල සභාපති හා ලේකම් දිස්ත්‍රික් සංවිධානයේ සාමාජිකයෝය. ප්‍රාදේශීය බල මණ්ඩල පිහිටුවා නොමැති දිස්ත්‍රික්කයන්හි පක්ෂ සාමාජිකයින්ගෙන් දිස්ත්‍රික් සංවිධානය ඇති කළ හැකිය.

ii) දිස්ත්‍රික් සංවිධානය මාසතුනකට (03) වරක් හෝ අවශ්‍ය පරිදි රැස්විය යුතුය.

iii) සභාපති, ලේකම්, භාණ්ඩාගාරික යනුවෙන් තිදෙනෙකු (03)කු නිළධාරීන් වශයෙන් පත්විය යුතුය. මසකට වරක් හෝ දිස්ත්‍රික්ක සංවිධානය පක්ෂ කටයුතු සම්බන්ධීකරණය කළ යුතුය.

iv) වසර දෙක (02) කට වරක් මධ්‍යම කාරක සභාව තීරණය කරන පිළිවෙත පරිදි නිලධාරීන් පත්කර ගත යුතුය.

12) ජාතික සම්මේලනය :-

අ) ජාතික සම්මේලනය අවුරුදු තුනකට (03) කට වරක් වත් මධ්‍යම කාරක සභාවේ තීරණය පරිදි පැවැත්විය යුතු වන්නේය. සැම ශාඛාවකම සභාපති, ලේකම්, භාණ්ඩාගාරික සහ පක්ෂ ශාඛාව මගින් තෝරනු ලබන සාමාජිකයින් 10 දෙනෙකුට එක් අයෙකු බැගින් ජාතික සම්මේලනය නියෝජනය කිරීමට අවසර ඇත.

ආ) මධ්‍යම කාරක සභාවට ජාතික සම්මේලනයට සහභාගී වීමට අනිවාර්ය අයිතියක් හිමිවේ.

ඇ) ජාතික සම්මේලනය පැවැත්විය යුතු දිනය මධ්‍යම කාරක සභාව විසින් තීරණය කළ යුතුය. එසේ නියම කළ දිනට සති හතකට (07) කට කලින් පක්ෂයේ සියළුම ශාඛා වෙත ලිඛිතව දැන්විය යුතුය.

ඈ) ගණපූර්ණය :- සභා සම්මේලනයේ ගණපූර්ණය ආරාධනය කරනු ලැබූ තුනෙන් එකක (1/3) සහභාගිත්වය විය යුතු අතර, ව්‍යවස්ථා සංශෝධනයේදී සම්මේලනයට පැමිණ ඇති නියෝජිතයින් තුනෙන් දෙකක (2/3) කැමැත්ත අවශ්‍ය වනු ඇත.

ඉ) සම්මේලනය පැවැත්විය යුතු දිනය පිළිබඳ ප්‍රධාන ලේකම්ගේ දැන්වීම් දින සිට දින 15ක් ඇතුළත පක්ෂ ශාඛා රැස්වී ඒ පිළිබඳව සාකච්චා කොට සම්මේලනයට ඉදිරිපත් කළ යුතු යෝජනා සහ සම්මේලනයට සහභාගි විය යුතු නියෝජිතයින් නම්කර ප්‍රධාන ලේකම්ට ලැබෙන්නට සැලැස්විය යුතුය.

ඊ) ශාඛාවල එම වාර්තාව ලැබීමෙන් අනතුරුව සම්මේලනයට ඉදිරිපත් වීමට සුදුසු යෝජනා අඩංගු න්‍යාය පත්‍රයක් මධ්‍යම කාරක සභාවේ අනුමැතිය පරිදි ප්‍රධාන ලේකම් විසින් පිළියෙල කළ යුතුය. එම න්‍යාය පත්‍රය සම්මේලනය ආරම්භ කරන අවස්ථාවේ රැස්වීමට සහභාගි වී සිටින සියළුම නියෝජිතයින්ට ලැබෙන්නට සැලැස්විය යුතුය. අති විශේෂ අවස්ථාවක කැඳවනු ලැබූ හෝ කැඳවීමට ඇති සම්මේලනය කල් දැමීමට මධ්‍යම කාරක සභාවට අයිතියක් ඇත. එය ප්‍රධාන ලේකම් විසින් සියළුම ශාඛා වලට දැන්විය යුතුය.

උ) විශේෂ සම්මේලනය :- පක්ෂයේ ශාඛා වලින් තුනෙන් දෙකක් (2/3)අත්සන් කරන ලද ඉල්ලීමක් මධ්‍යම .කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමෙන් හෝ මධ්‍යම කාරක සභාවේ මුළු සංඛ්‍යාවෙන් බහුතර සංඛ්‍යාවක තීරණයක් පරිදි පක්ෂයේ විශේෂ සම්මේලනයක් පැවැත්විය හැකිය. විශේෂ සම්මේලනයක් පැවැත්වීමේදී අඩුම වශයෙන් සති දෙකකට කලින් කැඳවීමේ හේතුව ප්‍රධාන ලේකම් පක්ෂ ශාඛාවලට දැන්විය යුතුය.

ඌ) ජාතික සම්මේලනයේ කාර්යයන් :-

i) ලේකම් වාර්තාව සාකච්ඡා කිරීම, අනුමත කිරීම.

ii) අයවැය වාර්තාව සාකච්ඡා කිරීම, අනුමත කිරීම.

iii) යෝජනා සාකච්ඡා කිරීම හා අනුමත කිරීම.

iv) මධ්‍යම කාරක සභාව තෝරා පත්කර ගැනීම.

v) ජාතික සම්මේලනය විසින් මධ්‍යම කාරක සභාව අළුතින් පත්කර ගැනීම. සඳහා වූ පිළිවෙත පළමු උප ලේඛණයේ සඳහන් කර ඇත.

13) මධ්‍යම කරක සභාව සංයුතිය හා බලතල :-

i) මධ්‍යම කාරක සභාව සාමාජිකයින් 32 දෙනෙකුගෙන් සමන්විත විය යුතුය. මධ්‍යම කාරක සභාව විසින් පක්ෂයේ සභාපති වරයාද, උප සභාපතිවරු තුන්දෙනෙක්ද, ප්‍රධාන ලේකම්, නියෝජ්‍ය ලේකම්, හා උප ලේකම්වරු තුන්දෙනෙක්ද, භාණ්ඩාගාරිකවරයෙකු සහ උප භාණ්ඩාගාරිකවරයෙකුද තෝරා පත්කළ යුතුය.

ii) සභාපති හා ප්‍රධාන ලේකම් ඇතුළුව මධ්‍යම කාරක සභිකයින් හත් (07) දෙනෙකුගෙන් සමන්විත දේශපාලන මණ්ඩලයක් මධ්‍යම කාරක සභාව විසින් තෝරා පත්කර ගත යුතුය.

iii) විසිපස් (25) දෙනෙකුගෙන් යුතු ජාතික උපදේශක සභාව මධ්‍යම කාරක සභාව විසින් තෝරා පත්කර ගත යුතුය. එයට පැවරෙන කාර්යයන් මධ්‍යම කාරක සභාව විසින් තීරණය කළ යුතුය.

iv) මධ්‍යම කාරක සභාව යටත් පිරිසෙන් මසකට වරක්වත් රැස්විය යුතුය. ගතවූ කාලය තුල දේශපාලනය මණ්ඩලය, පක්ෂ සංවිධානයේ දිස්ත්‍රික් සංවිධාන, ප්‍රදේශීය බල මණ්ඩල හා අනුබද්ධ සංවිධාන වල වැඩ කටයුතු පිළිබඳව සමාලෝචනය කලයුතු අතර ඉදිරි කාලය සඳහා එම සංවිධාන වලට අවශය උපදෙස් හා දේශපාලන මග පෙන්වීම කල යුතුය.

v) පක්ෂ ශාඛා, ප්‍රාදේශීය බල මණ්ඩල, දිස්ත්‍රික් සභාවල සංයුතිය හා බල ප්‍රදේශය තීරණය කිරීමද, පක්ෂ ශාඛා, ප්‍රාදේශීය බල මණ්ඩල, දිස්ත්‍රික් සභා සහ අනුබද්ධ සංවිධාන විසුරුවා හැරීමේ බලය මධ්‍යම කාරක සභාවට ඇත්තේය.

vi) පක්ෂයේ පූර්ණ උත්තරීතර බලතල මධ්‍යම කාරක සභාව වෙත පැවරී ඇත්තේය.

vii) ව්‍යවස්ථාවේ සඳහන් නොවන කරුණක් පිළිබඳව හෝ අර්ථ නිරූපනයක් අවශ්‍ය අවස්ථාවක ඒ පිළිබඳ මධ්‍යම කාරක සභාවේ තීරණය අවසාන තීරණය වේ.

viii) පක්ෂයේ මුදල්කමිටුව පත්කිරීමේ බලය මධ්‍යම කාරක සභාව වෙත පැවරී ඇත.

ix) පක්ෂයේ සභාපතිවරයා හෝ සභාපතිවරයාගේ ප්‍රධානත්වයෙන් පස් (05) දෙනෙකුගෙන් යුත් නාම යෝජනා කමිටුවක් මධ්‍යම කාරක සභාව විසින් ඉදිරිපත් කළ යුතුය.

x) අවශ්‍ය අවස්ථාවන්හිදී පක්ෂය විසින් එළඹිය යුතු මැතිවරණ ගිවිසුම් පිළිබඳව තීරණය කිරීමේ බලය මධ්‍යම කාරක සභාව වෙත පැවරී ඇත.

xi) අ) මධ්‍යම කාරක සභාවේ රැසවීම සඳහා ගණපූර්ණය 14 දෙනෙකි.

ආ) මධ්‍යම කාරක සභාවේ සභිකධුර පුරප්පාඩු වු විට මධ්‍යම කාරක සභාවේ වැඩි දෙනාගේ තීරණය අනුව මධ්‍යම කාරක සභාවට සභිකයින් පත්කර ගත යුතුය.

ඇ) මධ්‍යම කාරක සභා රැස්වීමට නොකඩවා තුන් (03) වරක් නොපැමිනීම හෝ සාමාජිකත්වය අහෝසිවීම හෝ මධ්‍යම කාරක සභාවෙන් නෙරපීම හෝ ඉල්ලා අස්වීම හෝ අභාවය මත මධ්‍යම කාරක සභික ධූරය අහෝසි වීමට හේතු වේ.

ඈ) පක්ෂයට හානිකර කටයුතු වල යෙදීම මත මධ්‍යම කාරක සභිකයින් තුනෙන් දෙකක(2/3) ගේ ඡන්දයෙන් මධ්‍යම කාරක සභාක ධූරයෙන් අස්කලහැකිය. එම සාමාජිකයා පිළිබඳ චෝදනා විනය මණ්ඩලයක් විසින් විභාග කළ යුතුය.

ඉ) තවද, 13 iv වැනි ඡේදය යටතේ සඳහන් කර ඇති අනුබද්ධ සංවිධායන් හි ක්‍රියාකාරීත්වය, මෙහෙයවීම, අවශ්‍ය තීරණය සහ දේශපාලන මගපෙන්වීම, මධ්‍යම කාරක සභාවට අයත් කාර්යයන්ය.

ඊ) මධ්‍යම කාරක සභිකයින් විසි එක් (21)දෙනෙකුගේ අත්සනින් යුතුව ප්‍රධාන ලේකම් වරයා වෙත ලිඛිතව කරන ඉල්ලීමක් අනුව ප්‍රධාන ලේකම් විසින් මධ්‍යම කාරක සභාව රැස්කළ යුතුය.

උ) මධ්‍යමකාරක සභාව මාසිකව හෝ අවශ්‍ය යැයි හැගෙන අවස්ථාවන්හි හෝ මධ්‍යම කාරක සභාව කැඳවීම සභාපතිවරයාගේ උපදෙස් පරිදි ප්‍රධාන ලේකම්වරයා කළ යුතුය.

ඌ) ඉහත ix ඈ උප වගන්තියේ සඳහන් අවස්ථාවේදී හැර මධ්‍යම කාරක සභාවේ සියළු තීරණයන් මධ්‍යම කාරක සභාකයින්ගේ බහුතරයේ කැමැත්තෙන් විය යුතුය.

xii) නිළධාරීන් :-

අ) සභාපති - මධ්‍යම කාරක සභාව විසින් මධ්‍යම කාරක සභිකයින් අතුරෙන් පමණක් පක්‍ෂයේ සභාපති පත්කරනු ඇත. පක්‍ෂයේ සභාපති මධ්‍යම කාරක සභාවේද, මැතිවරණ නාමයෝජනා කමිටුව, දේශපාලන මණ්ඩලයෙහිද සභාපති වන්නේය. මධ්‍යම කාරක සභාවේ හා පක්‍ෂයේ රැස්වීම් වල මුලසුන ගැනීම හා මෙහෙය වීමද, ප්‍රධාන ලේකම්වරයාට උපදෙස් නිකුත් කිරීමද, දේශීය හා විදේශීය වශයෙන් පක්‍ෂය නියෝජනය කිරීමද, ජාතික උපදේශක සභාවේ මුලසුන දැරීම, මධ්‍යම කාරක සභාව විසින් පවරනු ලබන බලතල හා කටයුතු කිරීමට ක්‍රියා කිරීම ඔහු සතු කටයුතු අතර වන්නේය.

ආ) උප සභාපතිවරු-මධ්‍යම කාරක සභාව විසින් මධ්‍යම කාරක සභිකයින් අතුරෙන් පක්‍ෂයේ උප සභාපතිවරු තුන්දෙනෙකු (03) කු පත්කරනු ඇත. සභාපති නැති අවස්ථාවක මධ්‍යම කාරක සභාවේ මුලසුන ගැනීම හා මධ්‍යම කාරක සභාව විසින් පවරනු ලැබූ වෙනත් බලතල හා කටයුතු ක්‍රියාත්මක කිරීම ඔවුන් සතු බලතල වනු ඇත.

ඇ) ප්‍රධාන ලේකම් - මධ්‍යම කාරක සභාව විසින් මධ්‍යම කාරක සභිකයින් අතුරෙන් පක්‍ෂයේ ප්‍රධාන ලේකම් පත්කරනු ඇත. පක්‍ෂයේ ප්‍රධාන ලේකම් මධ්‍යම කාරක සභාවේ ද ලේකම් වේ. මධ්‍යම කාරක සභාව කැඳවීම, එහි තීරණ ක්‍රියාත්මක කිරීම, වාර්තා තැබීම, චක්‍රලේඛන නිකුත් කිරීම, පක්‍ෂ සංවිධායකයින්ට උපදෙස් දීම, පක්‍ෂයේ තීරණ දැනුම් දීම, පක්‍ෂයේ නිල ප්‍රකාශ නිකුත් කිරීම, පක්‍ෂ සාමාජික ලේඛනය පවත්වාගෙන යාම, පක්‍ෂ මුලස්ථානයේ ලිපිනය වෙනස් වන අවස්ථාවේදී අදාල බලධාරීන්ට දැනුම් දීම හා මධ්‍යම කාරක සභාව විසින් පවරනු ලබන වෙනත් බලතල ඔහු සතු බලතල වන අතර පක්‍ෂයේ සභාපතිවරයාගේ උපදෙස් පරිදි ක්‍රියා කළ යුතුය.

ඈ) නියෝජ්‍ය ලේකම් - මධ්‍යම කාරක සභාව විසින් මධ්‍යම කාරක සභිකයින් අතුරෙන් නියෝජ්‍ය ලේකම් වරයෙකු පත්කරනු ඇත. සාමාන්‍ය අවස්ථාවල ප්‍රධාන ලේකම් වරයා විසින් පවරනු ලබන කටයුතු ක්‍රියාත්මක කිරීමේ වගකීම ඔහු වෙත පැවරී ඇත. ප්‍රධාන ලේකම් වරයා කිසියම් හේතුවක් නිසා තම නිල කටයුතු කිරීමට අපොහොසත් වු විට හෝ සෞඛ්‍ය හේතුන් නිසා හෝ විදේශ ගතවු විට හෝ මරණයට පත්වු විට හෝ ප්‍රධාන ලේකම්ධුරයේ සියළුම කටයුතු නිල වශයෙන් මෙහෙයවීම නියෝජ්‍ය ලේකම් විසින් කළ යුතුය. හා / හෝ ඉහත සඳහන් පරිදි ප්‍රධාන ලේකම්වරයාට තම නිල කටයුතු ව නිරතවීමට නොහැකිවු විට නියෝජ්‍ය ලේකම් ප්‍රධාන ලේකම් ලෙස කටයුතු කරනු ඇත. ඉහත සඳහන් කළ අවස්ථාවකදී නියෝජ්‍ය ලේකම් ප්‍රධාන ලේකම් ලෙස කටයුතු කල යුත්තේ පක්‍ෂයේ සභාපතිගේ උපදෙස් හා අනුමැතිය මතය.

ඉ) උපලේකම්වරු - මධ්‍යම කාරක සභාව විසින් මධ්‍යම කාරක සභිකයින් අතුරෙන් පක්ෂයේ උපලේකම්වරුන් තුන්දෙනෙකු (03) පත්කරනු ඇත. මධ්‍යම කාරක සභාව විසින් පවරනු ලබන වෙනත් බලතල හා කටයුතු ක්‍රියාත්මක කිරීම ද ඔවුන් සතු වගකීම වනු ඇත.

ඊ) භාණ්ඩාගාරික- මධ්‍යම කාරක සභාව විසින් මධ්‍යම කාරක සභිකයින් අතුරෙන් පක්ෂයේ භාණ්ඩාගාරික පත්කරනු ඇත. පක්ෂයේ මුදල් එකතුකිරීම, තැන්පත් කිරීම හා පාලනය ඔහු සතුය. මධ්‍යම කාරක සබාවේ අනුමැතිය පරිදි අදාල කටයුතු සඳහා මුදල් වැය කිරීම හා එකතු කිරීමද මාසිකව හා වාර්ෂිකව අයවැය ලේඛණයක් සකස් කර මධ්‍යම කාරක සභාවේ අනුමැතියද ඇතිව ජාතික සම්මේලනයට ඉදිරිපත් කිරීමද ඔහු සතු වගකිම වනු ඇත. පක්ෂයේ මුදල් පිළිබඳ සියළු ලිපි ලේඛණ සකස් කිරීම හා තබා ගැනිම ඔහු සතු කාර්යයයි.

උ) මධ්‍යම කාරක සභාව විසින් මධ්‍යම කාරක සභිකයින් අතුරින් පක්ෂයේ උප භාණ්ඩාගාරික වරයෙකු පත්කරනු ඇත. මධ්‍යම කාරක සභාව විසින් පවරනු ලබන මුදල් කටයුතු සම්බන්ධ වෙනත් බලතල හා කටයුතු ක්‍රියාත්මක කිරීම ඔහු සතු වගකීම වනු ඇත.

14) විනය මණ්ඩලය :-

i) පක්ෂයේ විනය සම්බන්ධව කටයුතු කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවන්හිදී මධ්‍යම කාරක සභාව විසින් පැන නැඟ ඇති කාරණය පිලිබඳ පරීක්ෂාකර බලා තීරණයක් පක්ෂයේ මධ්‍යම කාරක සභාවට ඉදිරිපත් කිරීම සඳහා පක්ෂයේ තුන් (03) දෙනෙකුගෙන් සමන්විත විනය මණ්ඩලයක් පත්කළ යුතුය.

ii) විනය මණ්ඩලයේ යෝජනා ක්‍රියාත්මක කිරීම මධ්‍යම කාරක සභාව සතු වන්නේය.එම කාරණය පිළිබඳව මධ්‍යම කාරක සභාව හෝ පක්ෂ සාමාජිකත්වය අහෝසි කිරීම හෝ වෙනත් දඩුවමක් නියම කල හැකිය.

iii) විනය මණ්ඩලයේ කාර්ය පටිපාටිය මෙහි පහත දෙවැනි උප ලේඛණයේ සඳහන් පරිදි විය යුතුය.

15) ජාතික උපදේශක සභාව :-

ජාතික උපදේශක සභාව සාමාජිකයින් 25 විසිපස්දෙනෙකුගෙන් සමන්විත යුතුය. ජාතික උපදේශක සභාවට සාමාජිකයින් පත් කිරීම හා එහි කාර්ය භාරය පක්ෂයේ මධ්‍යම කාරක සභාව විසින් තීරණය කළයුතුය.

16) දේශපාලන මණ්ඩලය :-

පක්ෂයේ ප්‍රධාන ලේකම් වරයා දේශපාලන මණ්ඩලයේද ලේකම්වරයා වන්නේය. පක්ෂයේ සභාපතිවරයා දේශපාලන මණ්ඩලයේද සභාපති වරයා වන්නේය. දේශපාලන මණ්ඩලය යටත් පිරිසෙන් සතියකට වරක්වත් රැස්වීම් පැවැත්විය යුතුය. රැසවීම් කැඳවීම අවශ්‍ය පරිදි ලේකම්වරයා විසින් කළ යුතු අතර, පක්ෂයට සම්බන්ධ සියළු කටයුතු පිළිබඳව විමසිලිමත් විය යුතුය.

17) කාලීනව පවත්නා දේශපාලන කරුණු සලකා බැලිමෙන් පසු පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ අනුමැතිය පරිදි කලින් කලට මෙරට පවත්වනු ලබන මැතිවරණ සඳහා සහ පොදු අරමුණු සඳහා වන ගිවිසුම් වලට අනිකුත් දේශපාලනය පක්ෂ සමග ඇතුළත්වීමට හැකිය.

18) පක්ෂයේ මුදල් :-

i) සාමාජික මුදල්

ii) ආධාර හා පරිත්‍යාග වශයෙන් පක්ෂයේ මුදල් නම් කරනු ඇත. පක්ෂයේ සාමාජික ප්‍රවේශ මුදල රු 10/ක්ද, වාර්ෂික සාමාජික මුදල රු 100/ක්ද වන්නේය. එකී සාමාජික මුදල වාරික 2 කින්ද ගෙවිය හැකිය. සාමාජික මුදල් නියමිත දිනට නොගෙවා සිටීම හේතුකොටගෙන මධ්‍යම කාරක සභාවේ අනුමැතිය ඇතිව සාමාජිකත්වය අහෝසි කළ හැකිය.

iii) පක්ෂයේ ආධාර මුදල් පක්ෂයේ වැඩ කටයුතු වෙනුවෙන් පාක්ෂිකයින්ගෙන්ද, පරිත්‍යාග මුදල් පක්ෂයේ හිතුවතුන්ගෙන්ද ලබා ගන්නා මුදල් වනු ඇත. මේ මුදල් එකතු කිරීම භාණ්ඩාගාරිකගේ වගකීම වන අතර, පක්ෂයේ ප්‍රධාන ලේකම්, භාණ්ඩාගාරික යන දෙදෙනා නමින් බැංකු ගිණුම් හෝ ඉතිරිකිරීමේ ගිණුම් හෝ වෙනත් ආයෝජන හෝ පවත්වා ගෙන යා යුතුය.

iv) මේ පිළිබඳව මාසික වාර්තාවක් භාණ්ඩාගාරික විසින් මධ්‍යම කාරක සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

19) මුදල් කමිටුව :-

පක්ෂයේ සභාපතිගේ ප්‍රධානත්වයෙන් හා ප්‍රධාන ලේකම්, භාණ්ඩාගාරික හා වෙනත් තුන් (03) දෙනෙකුගෙන් සමන්විත යුතු වන්නේය.

20) ගනපුර්ණය :-

පක්ෂයේ මධ්‍යම කාරක සභා රැස්වීමට හැර පක්ෂයේ සංවිධානවල රැස්වීම් වලට අවශ්‍ය ගණපුර්ණය තුනෙන් එකක් (1/3) වනු ඇත.

21) නාමයෝජනා කමිටුව :-

අ) මැතිවරණ කොමසාරිස්වරයා විසින් කලින් කලට නියම කරනු ලබන මැතිවරණ සහ ජනමත විචාරණ සඳහා මධ්‍යම කාරක සභාව විසින් ඉදිරිපත් වීමට තීරණය කරනු ලබන අවස්ථාවක, එකී මැතිවරණ සඳහා මහජන එක්සත් පෙරමුණ මගින් ඉදිරිපත් කරනු ලබන අපේක්ෂකයින් සහ පත්කරන අය තේරීම නාම යෝජනා මණ්ඩලයේ බලතල වේ.

ආ) මැතිවරණ කොමසාරිස් වරයා විසින් මහජන එක්සත් පෙරමුණට නියම කරනු ලබන පත්වීම් පිළිබඳව පත්කළ යුතු අය තේරීමේ බලයද නාමයෝජනා කමිටුවට ඇත.

22) මහජන එක්සත් පෙරමුණ විසින් මැතිවරණය සඳහා ඉදිරිපත් කරන අපේක්ෂකයින් හා එසේ ඉදිරිපත්වී තේරී පත්වන සහ පත්කරනු ලබන සියළු තැනැත්තන් පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ නියෝගයන්ට හා තීරණයන්ට අනුව කටයුතු කළ යුතුය. එසේ කටයුතු නොකරන අය පිළිබඳව තීරණයක් ගැනීමේ බලය මධ්‍යම කාරක සභාව සතුවේ. එම තීරණයන්ට හෝ නියෝගයන්ට පටහැනිව කටයුතු කිරීම සම්බන්ධයෙන් අදාල තැනැත්තන්ට විරුද්ධව විනයානුකුලව හෝ වෙනත් එවිනි තීරණයක් ගැනීමේ පුර්ණ බලය මධ්‍යම කාරක සභාව සතුය.

## පළමුවන උප ලේඛනය

## මධ්‍යම කාරක සභිකයින් පත්කිරීම හා මධ්‍යම කාරක සභාවේ

## ප්‍රථම රැස්වීම අනුගමනය කලයුතු පිළිවෙත

01) සම්මේලනයට පැමිණ සිටින අය අතරින් හෝ පැමිණීමට නොහැකි බවට ලිඛිතව දන්වා ඇති අය අතරින් විය යුතුය.

02) පක්ෂයේ ශාඛා සංවිධානය හෝ පක්ෂයට අනුබද්ධ සංවිධානයක සාමාජිකයෙකු විය යුතුය.

03) නියමිත සම්මේලනයේ අවස්ථාව වන විට විනය කැඩීම පිළිබඳ චෝදනා වකට ලක්ව එම විනය පරීක්ෂණය තවමත් පවතින අයෙකු නොවිය යුතුය.

04) ඉහතින් 1,2, සහ 3 යන වගන්ති වලට අනුකූල වන සාමාජිකයින්ගේ නම් සාමාජික යෙකු විසින් යෝජනා කර තවත් සාමාජිකයෙකු විසින් ස්ථිර කර සභාපති මණ්ඩලය වෙත ලිඛිතව ඉදිරිපත් කල යුතුය.

05) මෙසේ ඉදිරිපත් කරනු ලබන නාම යෝජනා භාරගැනීමට සහ ඉහත සඳහන් සුදුසුකම් තිබේදැයි පරීක්‍ෂා කර බැලීමටත්, එය මෙහෙයවීමටත්, නම් තේරීමටත්,ජාතික සම්මේලනයේ සභාපති මණ්ඩලය විසින් කමිටුවක් පත්කල යුතුය. එම කමිටුව සම්මේලනයේ අනුමැතිය ලබා ගත යුතුය. මෙම කමිටුවේ සාමාජිකයින් තුනකි. ඔවුන් මධ්‍යම කාරක සභාවට යෝජනා කරන අයගෙන් බාහිර අය විය යුතුය.

06) මධ්‍යම කාරක සභාවට යෝජිත නාම ලේඛනය පරීක්ෂා කිරීමේදී,

- අ) එක් දිස්ත්‍රික්ක සභාවකින් අවමය දෙදෙනෙකු (2) වන පරිද්දෙන් ,

- ආ) හැකිතාක් දුරට කම්කරු, ගොවි, තරුණ, හා කාන්තා සංවිධාන වෙන්වෙන් දෙදෙනා බැගින්ද නියෝජනය වන පිරිද්දෙන් යෝජිත නාම ලේඛනය සකස් කළ යුතුය.

- ඇ) මෙම ලේඛණය සකස් කිරීමේදී යෝජනා කරනු ලැබ ඇති සාමාජිකයින් පක්ෂ සංවිධානයේ ක්‍රියාකාරීත්වය ආදී අවශ්‍ය සුදුසුකම් සඳහා ප්‍රමුඛත්වය දීම සුදුසු වන අතර අවශ්‍ය වූ විටෙක ගතවූ වර්ෂයේ සිටි ප්‍රධාන ලේකම් ගෙන් තොරතුරු ලබා ගත හැකිය.

- ඈ) මේ අනුව පක්ෂයේ මධ්‍යම කාරක සභිකයින් තිස්දෙදෙනෙකු (32) දෙනෙකු පත්කර ගැනීමට ක්‍රියා කළ යුතුය.

- ඉ) ඡන්ද විමසීමක් පැවති විටෙක එහි ප්‍රතිඵල ස්මමේලනයේ සභාපති මඩුල්ල විසින් ප්‍රකාශයට පත්කරනු ඇත.

7) ජාතික සම්මේලනයේ සභාපති මඩුල්ල විසින් සම්මේලනයේ අවසානයේදී මධ්‍යම කාරක සභාවේ ප්‍රථම රැස්වීමකැඳවා අවශ්‍ය නිළධාරීන් පත්කර ගත යුතුය.

## දෙවන උපලේඛණය

## විනය කාර්ය පටිපාටිය

01) පක්ෂ සාමාජිකයෙකු විසින් පක්ෂ විනය උල්ලංඝනය කිරීමක් සිදු කරනු ලැබුවේ යැයි තොරතුරක් ප්‍රධාන ලේකම්වරයා වෙත ලැබුනු වහාම ඒ පිළිබඳව නිදහසට කරුණු විමසමින් ප්‍රධාන ලේකම් වරයා විසින් අදාල සාමාජිකයා වෙත ලියා පදිංචි තැපැලෙන් ලිපියක් යැවිය යුත්තේය.

02) එකී ලිපියේ දින සිට දින හතක (07) කාලයක් තුළ අදාල සාමාජිකයා විසින් තම නිදහසට හේතුදැක්වීම ලිඛිතව ලියාපදිංචි තැපෑලෙන් ප්‍රධාන ලේකම් වරයා වෙත එවනු ලැබිය යුත්තේය.

03) එකී දින හතක (07) කාලසීමාව තුල අදාල සාමාජිකයා විසින් නිදහසට කරුණු පැහැදිලි කිරීමක් ඉදිරිපත් කැ ලැබුවහොත් සහ එකී කරුණු පැහැදිලි කිරීම පිළිබඳව ප්‍රධාන ලේකම්වරයා සෑහීමකට පත්නොවුවහොත් අදාල විනය උල්ලංඝනය කිරීම පිළිබඳව චෝදනා පත්‍රයක් ප්‍රධාන ලේකම්වරයා විසින් අදාල සාමාජිකයා වෙත ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුත්තේය. චෝදනා පත්‍රය භාරදීමත් සමගම අදාල සාමාජිකයාගේ සාමාජිකත්වය තාවකාලිකව අත්හිටවිය යුත්තේය.

04) එකී චෝදනා පත්‍රයේ පිටපතක් ප්‍රධාන ලේකම්වරයා විසින් විනය මණ්ඩලය වෙත භාරදිය යුතු අතර අදාල සාමාජිකයාට විරුද්ධව පරීක්ෂණයක් පැවැත්වීම සඳහා දිනයක් හා වේලාවක් නියම කොට චූදිත සාමාජිකයාට සහ ප්‍රධාන ලේකම්වරයාට එකී දිනය සහ වේලාව විනය මණ්ඩලය විසින් දැනුම් දිය යුතු බවට ප්‍රධාන ලේකම්වරයා විනය මණ්ඩලයට දන්වා සිටිය යුතුය.

05) විනය මණ්ඩලය විසින් පරීක්ෂණය පැවැත්වීම සඳහා දිනයක් හා වේලාවක් නියමකොට චූදිත තැනැත්තා අදාල චෝදනාවෙන් නිදහස් වීම සඳහා තමා ඉදිරිපත් කිරීමට අදහස් කරන සියළු වාචික හා ලිඛිත සාක්ෂි සමග විනය පරීක්ෂණය සඳහා විනය මණ්ඩලය ඉදිරියේ පෙනීසිටිය යුතු බවට දැනුම් දෙමින් එකී චූදිත තැ ත්තාට ලියාපදිංචි තැපැලෙන් ලිපියක් යැවිය යුතුය.

06) විනය පරීක්ෂණය පැවැත්වෙන දිනය හා වේලාව විනය මණ්ඩලය විසින්, ප්‍රධාන ලේකම්වරයාට දැන්විය යුතුය.

07) විනය මණ්ඩලය විසින් දෙපාර්ශවය ඉදිරිපත් කරනු ලබන සියළු වාචික හා ලිඛිත සාක්ෂි සලකා බලා තම තීරණයට එළඹිය යුතුය.

08) විනය මණ්ඩලය තම තීරණයේ චූදිත තැනැත්තා චෝදනා පත්‍රයේ සඳහන් චෝදනා වලට වැරදිකරුද නිව ි කරුද සහ චෝදනාපත්‍රයේ සඳහන් එක් එක් චෝදනාවන්ට වැරදි කරුද නිවැරදි කරුද යන්න වෙන් වෙන් වශයෙන් සඳහන් කළ යුතුය.

09) වද ඔප්පුවී ඇති චෝදනා වලට කවර දඬුවම් නියම කළ යුත්තේදැයි විනය මණ්ඩලය විසින් තම තීරණයේ නිර්දේශ කළ යුතු අතර , එකී දඬුවම් වශයෙන් ;

- අ) අවවාද කිරීම
- ආ) නිලතල වලින් නෙරපා දැමීම.
- ඇ) සාමාජිකත්වයෙන් නෙරපා හැරීම නිර්දේශ කළ හැක්කේය.

10) විනය මණ්ඩලයේ තීරණය මධ්‍යම කාරක සභාවවෙත, විනය මණ්ඩලය විසින් ලිඛිතව දැනුම් දිය යුතු අතර, තීරණයට විනය මණ්ඩලයේ සාමාජිකයින් සියළු දෙනාම අත්සන් තැබිය යුතුය.

11) ඉහත 1 වන ඡේදයේ සඳහන් පරිදි ප්‍රධාන ලේකම්වරයා විසින් නිදහසට කරුණු විමසා යවනු ලබන ලිපි දින හතක (07)කාල සීමාව තුල ලිඛිතව පිළිතුරු එවනු නොලබන සාමාජිකයන් අදාල වරද කරනු ලැබූ තැනැත්තෙකු සේ සලකා එකී තැනැත්තා සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සඳහා එම කාරණය මධ්‍යම කාරක සභාවට යොමු කළ යුතුය.



ඵඵඵඵඵඵඵඵඵඵඵඵඵඵඵඵඵඵඵ